**Business & Accounting Studies** | 60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2017 සැප්තැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, September 2017

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*


## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01. ව්‍යාපාරයක විවිධ අරමුණු පවතී. ඒ අතුරින් පුද්ගල දක්ෂතා හා සම්බන්ධ වූ ව්‍යාපාරික අරමුණ වනුයේ,
1. සේවක සුභ සාධනය
2. ලාභ ඉපයීම
3. රැකියා උද්පාදනය
4. ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම.

02. භාණ්ඩ හා සේවා සසඳන කල සේවා වල දැකිය හැකි ලක්ෂණ නිවැරදිව ඇතුළත් වනුයේ,
1. අස්පෘශ්‍ය බව, විවිධත්වය, ගබඩා කළ නොහැකි වීම.
2. ස්පෘශ්‍ය බව, විවිධ වීම, ගබඩා කළ හැකි වීම.
3. අස්පෘශ්‍ය වීම, ඒකාකාරී වීම, හිමිකරුවෙකු සිටීම.
4. ස්පෘශ්‍ය වීම, ඒකාකාරී බව, ගබඩා කළ හැකි වීම.

03. රජය ව්‍යාපාර කෙරෙහි මෙන්ම ව්‍යාපාර රජය කෙරෙහි ඇල්මක් දක්වනුයේ,
1. රැකියා උද්පාදනය
2. සමාජ සේවා සුබ සාධනය
3. ආදායම් බදු නිසි ලෙස ගෙවීම
4. දිරි ගැන්වීම් ලබා ගැනීම

04.



ඉහත දැක්වෙනුයේ, ව්‍යාපාර පරිසර වර්ගීකරණයකි. එහි A කාණ්ඩයට ඇතුළත් සාධක වනුයේ,
1. අයිතිකරුවන්, සේවකයන්, ගනුදෙනුකරුවන්
2. කළමණාකරුවන්, සේවකයන්, අයිතිකරුවන්
3. ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, තරගකරුවන්
4. අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, කළමණාකරුවන්

05. පහත සංවිධාන අතුරින් ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානය වනුයේ,
1. රාජ්‍ය සමාගම්
2. හවුල් ව්‍යාපාර
3. දෙපාර්තමේන්තු
4. සමුපකාර සමිති

06. ව්‍යාපාර සංවිධාන කිහිපයක් හා ඒවාට අදාල කරුණු කිහිපයක් පහත වේ.

| **ව්‍යාපාර සංවිධාන** | **අදාල කරුණු** |
|---|---|
| A - හවුල් ව්‍යාපාර | 1. කොටස් නිදහසේ පැවරිය හැක. |
| B - දෙපාර්තමේන්තු | 2. අවමය 2 හා උපරිමය 20 වේ. |
| C - සීමා සහිත සමාගම් | 3. ප්‍රජාතන්ත්‍රවාදි පාලනය |
| D - සමුපාකාර | 4. නෛතික පුද්ගලභාවයක් නැත. |

ඉහත කරුණු නිවැරදිව ගලපා ඇත්තේ,
1. A - 2, B - 3, C - 1, D - 4
2. A - 3, B - 4, C - 1, D - 2
3. A - 2, B - 4, C - 1, D - 3
4. A - 4, B - 3, C - 2, D - 1

07. කේවල ස්වාමි ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක ඇති සමානකම් වනුයේ,
1. අවම සාමාජික සංඛ්‍යාව 01 වීම, ලියාපදිංචිය අන්වාර්ය වීම.
2. අඛණ්ඩ පැවැත්ම, වගකීම් අසීමිත වීම, නෛතික පුද්ගලභාවය නොමැති වීම.
3. අඛණ්ඩ පැවැත්මක් නොවීම, නෛතික පුද්ගලභාවයක් නැත.
4. 1890 හවුල් පනතෙහි බලපෑම, තීරණවල සාපේක්ෂ අසාර්ථකභාවය.

08. කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දි අනුගමනය කළ යුතු පියවර කිහිපයක් පහත වේ.
A - ග්‍රාම නිලධාරී වාර්තාව ලබා ගැනීම.
B - ලියාපදිංචි කිරීමේ සහතිකය ව්‍යාපාරික ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම.
C - අදාල ඉල්ලුම්පත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීම.
D - ලියාපදිංචි වීමේ ගාස්තුව පලාත් සභාවට ගෙවීම.
ඉහත පියවර නිවැරදිව ඇතුළත් පිළිතුර වනුයේ,
1. C, D, A, B 2. C, A, D, B 3. A, C, B, D 4. C, B, A, D

09. චෙක්පතක දක්නට ලැබෙන චුම්බක තීරුවේ ඇති අංක පිළිවෙල වනුයේ,
A - බැංකු අංකය B - චෙක්පත් අංකය C - ශාඛා අංකය D - ගිණුම් අංකය
1. B, C, A, D 2. D, A, B, C 3. D, A, C, B 4. B, A, C, D

10. විද්‍යුත් මුදල් ලෙස නොසැලකෙන්නේ,
1. සංචාරක චෙක්පත් 2. ණයපත් 3. හරපත් 4. ටෙලර් කාඩ්පත්

11. යම් පුද්ගලයෙකුට ජංගම ගිණුමක් විවෘත කිරීමට අවශ්‍යතාවයක් ඇත. ඒ සඳහා ඔහු යා යුතු වන්නේ,
1. ජාතික ඉතිකිරීමේ බැංකුව 2. ලංකා බැංකුව
3. මහ බැංකුව 4. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

12. ලලිත් වෙළෙඳ පොළ අගය රු. 2,000,000ක් වටිනා මෝටර් රථයක් සඳහා රු. 1,000,000 ක රක්ෂණ ඔප්පුවක් ලබාගෙන ඇත. රථය හදිසි අනතුරකට ලක්වීමෙන් සිදුවූ පාඩුව රු. 400,000 කි. එසේ නම් රක්ෂණ සමාගම විසින් ලලිත්ට ලබාදෙන මුදල් වන්දිය වනුයේ,
1. රු. 2,000,000 2. රු. 400,000 3. රු. 1,000,000 4. රු. 240,0000

13. පහත සඳහන් ප්‍රවාහනයේ මූලිකාංග හා ඊට අදාල නිදසුන් කිහිපයකි. ඒවා නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
A - මාර්ගය 1. වරාය, ගුවන්තොටුපළ
B - මාධ්‍ය 2. බස්රිය, නැව
C - බලය 3. මහාමාර්ග, ගුවන් මාර්ග
D - පර්යන්තය 4. සූර්ය ශක්තිය, ඛනිජ තෙල්
1. A - 2 B - 3 C - 1 D - 4 2. A - 3 B - 2 C - 4 D - 1
3. A - 3 B - 1 C - 4 D - 2 4. A - 1 B - 4 C - 2 D - 3

14. කළමණාකරණ ක්‍රියාවලියේ කාර්යයන් අතුරෙන්, යහපත් වෘත්තීය සබඳතා, නිවැරදි නායකත්වය, උපදෙස් දීම ආදිය පිලිබඳව ඇතුලත් වන්නේ,
1. සැලසුම්කරණය 2. පාලනය 3. සංවිධානකරණය 4. මෙහෙයවීම

15. ව්‍යාපාරයට වඩාත් ආකර්ශණීය ලෙස මෙන්ම ලාභදායී ව තෘප්තිමත් කළහැකි පාරිභෝගිකයන්ගෙන් සමන්විත වෙළෙඳපොල වනුයේ,
1. ගනුදෙනුකරු වෙළෙඳ පොල 2. ඉලක්ක වෙළෙඳ පොල
3. අලෙවිකරණ වෙළෙඳ පොල 4. පාරිභෝගික වෙළෙඳ පොල

16. අලෙවි මිශ්‍රය හා ඊට අදාල විචලනයන් පහත වේ.

| **අලෙවි මිශ්‍රය** (P) | **විචලයයන්** (Q) |
|---|---|
| A - මිල | 1. විකුණුම් ප්‍රවර්ධනය |
| B - නිෂ්පාදිතය | 2. දීමනා |
| C - ස්ථානය | 3. ආවරණ ප්‍රදේශ |
| D - ප්‍රවර්ධනය | 4. ඇසුරුම |

ඉහත P හි දැක්වෙන මිශ්‍රයන්ට අදාල Q හි දැක්වෙන විචලනයන් නිවැරදිව ගලපා ඇති පිළිතුර වනුයේ,
1. A - 1, B - 2, C - 4, D - 3 2. A - 2, B - 3, C - 1, D - 4
3. A - 2, B - 4, C - 3, D - 1 4. A - 1, B - 2, C - 3, D - 4

17. ගිණුම්කරණ සමීකරණයේ වගකීම් අඩුවීමට හා හිමිකම් වැඩිවීමට බලපාන ගනුදෙනුව වනුයේ,
   1. බැංකු ණයක් ව්‍යාපාරයේ මුදලින් ගෙවීම
   2. ණයහිමියන්ගෙන් මුදල් ලැබීම
   3. බැංකු ණය පොළී ගෙවීම
   4. ණයහිමියන්ට අයිතිකරු පෞද්ගලික මුදලින්ගෙවීම.

18. මන්දිවි ලී බඩු සමාගම ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 150,000ක් වටිනා කාර්යාල ලී බඩු ද අලෙවි කිරීම සඳහා රු. 300,000ක් වටිනා කාර්යාල ලී බඩු ද අලෙවි කිරීම සඳහා රු. 300,000ක් වටිනා ලී බඩු උපකරණ ද හේසර සහ සමාගමෙන් ණයට ගන්නා ලදි. ලී බඩු උපකරණ රු. 400,000ක් ඒදිනට අත්පිට මුදලට විකුණන ලදි. ඉහත ගනුදෙනු වාර්තා කිරීමට අදාල මූලික පොත් පිළිවෙලින් දැක්වෙනුයේ,
   1. පොදු ජ'නලය, ගැණුම් ජ'නලය, මුදල් පොත.
   2. පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, ගැණුම් ජ'නලය
   3. ගැණුම් ජ'නලය, ගැණුම් ජ'නලය, මුදල් පොත
   4. පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, විකුණුම් ජ'නලය

19. සුළු මුදල් ප්‍රතිපූරණයට අදාල ද්විත්ව සටහන වනුයේ,

1. සුළු මුදල් පොත හර
   වියදම් බැර

2. සුළු මුදල් පොත හර
   ප්‍රධාන මුදල් පොත බැර

3. ප්‍රධාන මුදල් පොත හර
   සුළු මුදල් පොත බැර

4. ප්‍රධාන මුදල් පොත හර
   වියදම් බැර

❖ ලහිරු විසින් x සමාගමෙන් රු. 200,000 ක ලකුණු කල මිල සහිත භාණ්ඩ ණයට ගන්නා ලදි. වෙළෙඳ වට්ටම 10% කි. මෙම ණය මුදල 2017.03.31ට පෙර පියවුවහොත් 5%ක මුදල් වට්ටමක් දෙන බවට x සමාගමෙන් පොරොන්දු විය. ලහිරු විසින් 2017.03.25වන දින සම්පූර්ණ මුදල පිය වුයේ නම්,

20. ලහිරු විසින් පිය වු මුදල කීය ද?
   1. රු. 190,000
   2. රු. 180,000
   3. රු. 171,000
   4. ඉහත කිසිවක් නොවේ.

21. ඊට අදාලව ලහිරුගේ පොත් වල තැබිය යුතු ද්විත්ව සටහන කුමක් ද?

1.

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 180,000 |
| ලද වට්ටම් | බැර | 9,000 |
| මුදල් ගිණුම | බැර | 171,000 |

2.

| | | |
|---|---|---|
| ණයගැති ගිණුම | හර | රු. 200,000 |
| දුන් වට්ටම් ගිණුම | බැර | 10,000 |
| මුදල් ගිණුම | බැර | 190,000 |

3.

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 200,000 |
| ලද වට්ටම් | බැර | 20,000 |
| මුදල් ගිණුම | බැර | 180,000 |

2.

| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 180,000 |
| ලද වට්ටම් ගිණුම | බැර | 18,000 |
| මුදල් ගිණුම | බැර | 162,000 |

22. ව්‍යාපාරය සකස් කරන ලද බැංකු ගිණුමේ බැර ශේෂය එම ව්‍යාපාරයේ,
   1. වත්කම කි.
   2. වගකීම කි
   3. ආදායම කි.
   4. වියදම කි.

23. පහත ගනුදෙනු අතුරින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා වැඩි වනුයේ,
   1. සෘජු ප්‍රේශණ, බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු
   2. ස්ථාවර නියෝග ලැබීම්, තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවු චෙක්
   3. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවු හා තැන්පත් කලමුත් උඵලබ්ධි නොවු චෙක්
   4. බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු, ස්ථාවර නියෝග ගෙවීම්

24. වර්තමානයේ බොහෝ ව්‍යාපාර සංවිධාන ඒවායේ ගිණුම්කරණ කටයුතු පරිගණක ගතකර ඇත. පහත දෑ අතුරෙන් ගිණුම්කරණ මෘදුකාංග පැකේජයක් නොවන්නේ,
   1. MYOB
   2. Saga
   3. One note
   4. Acc Pac

25. පහත දැක්වෙනුයේ ගිණුම්කරණ වැරදි කිහිපයකි. ඒ අතුරින් ශේෂ පිරික්සුම තුළින් අණාවරණය වනුයේ,

1. රු. 10,000ක දුරකථන බිල ගෙවීම රු. 1,000ක් ලෙස ගිණුම් පොත් වල සටහන් වීම.
2. රු. 5,000ක විදුලි බිල ගෙවීම එම ගිණුමේ පමණක් සටහන් වීම.
3. රු. 50,000ක ණයට විකුණුම්, ඉන්වොයිසියෙන් ගිණුම් පොත් වලින් මග හැරීම.
4. රු. 1,000ක ගෙවල් කුලි ගෙවීම ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීම.

26. පහත ගනුදෙනු අතුරෙන් වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනුව වනුයේ,

1. රු. 15,000ක බැංකු ණයක් ගැනීම.
2. රු. 100,000ක අමතර ප්‍රාග්ධනය යෙදීම.
3. රු. 2,000ක විදුලි බිල ගෙවීම
4. රු. 5,000 තොග ණයට විකිණීම.

27. පහත ගිණුම් අතුරින් පියවී යන ගිණුම් වනුයේ,

1. ආදායම්, වගකීම්
2. වත්කම්, වගකීම්
3. ආදායම්, වියදම්
4. හිමිකකම්, ආදායම්

❖ පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට මෙම තොරතුරු ඔබට සපයා ඇත.

A - රු. 25,000 ණයහිමියන්ට ගෙවන ලදි.
B - රු. 425,000 ගෙවල් කුලි ලැබුණා.
C - රු. 75,000 අයිතිකරු ගැනිලි කලා.
D - රු. 50,000 උපකරණ මිලදී ගත්තා
E - රු. 10,000 විදුලි බිල ගෙව්වා

28. මෙම ගනුදෙනුව අවසානයේ ව්‍යාපාරයේ මුදල් ගිණුමේ ශේෂයේ වැඩිවීම වනුයේ,

1. රු. 265,000
2. රු. 425,000
3. රු. 175,000
4. ඉහත කිසිවක් නොවේ.

29. මෙම ගනුදෙනු අවසානයේ ජංගම වත්කම්වල වර්ධනය වනුයේ,

1. රු. 425,000
2. රු. 265,000
3. රු. 315,000
4. ඉහත කිසිවක් නොවේ.

30. ඉහත ගනුදෙනු අවසානයේ ව්‍යාපාරයේ මුළු වත්කම් හා මුළු හිමිකම වනුයේ,

1. රු. 315,000 හා රු. 340,000
2. රු. 175,000 හා රු. 365,000
3. රු. 50,000 හා රු. 750,000
4. රු. 265,000 හා රු. 425,000

31. වියදම් වලට හා වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනුව වන්යේ,

1. A
2. D
3. C
4. E

32. රු. 100,000 කට ලකුණු කළ මිල වු උපකරනයක් මිලට ගැනීමේ දි 10% ක වෙළෙඳ වට්ටමක් හිමිවිය. එය,

1. ගැණුම් ජ්නලය තුළ එය රු. 90,000ක් ලෙස සටහන් කළ යුතුය.
2. පොදු ජ්නලය තුළ රු. 90,000ක් ලෙස වාර්තා කල යුතුය.
3. මුදල් පොත රු. 90,000 ක් බැර කළ යුතුය.
4. මුදල් පොත රු. 90,000ක් බැරට ද රු. 10,000ක් ලද වට්ටම් ලෙසද සටහන් කළ යුතුය.

33. රු. 6,000ක බැංකු ගාස්තුවක් අයකල බව වාර්තා කිරීමට අදාල මුලාශ්‍ර ලියවිල්ල වනුයේ,

1. ඉන්වොයසිය
2. පිළිපත
3. ලදුපත
4. බැංකු ප්‍රකාශය.

❖ පහත දැක්වෙන තොරතුරු උපයෝගි කර අංක 34 සිට 40 දක්වා ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
ගංගා වෙළෙඳ ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| තොගය (2016.01.01) | 5,000 | |
| ගැණුම් | 35,000 | |
| විකුණුම් | | 100,000 |
| මෝටර් රථය (පිරිවැය) | 300,000 | |
| මෝටර් රථ ක්ෂය වෙන්කිරිම (2016.01.01 දිනට) | | 30,000 |
| ගෙනඒමේ කුලී | 4,000 | |
| දුන් වට්ටම් | 6,000 | |
| ලද වට්ටම් | | 10,000 |
| 10% බැංකු ණය | | 50,000 |
| රක්ෂණ ගාස්තු | 8,000 | |
| පරිපාලන ගාස්තු | 2,000 | |
| බැංකු අයිරාව | | 20,000 |
| ප්‍රාග්ධනය | | 150,000 |
| | 360,000 | 360,000 |

අතිරේක තොරතුරු
1. 2016.12.31 දිනට තොගය රු. 10,000
2. මෝටර් රථ ක්ෂය සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 5% බැගින් ක්ෂය කළ යුතුය.

34. මෙම ව්‍යාපාරයේ 2016.12.31 න් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වන්නේ,
1. රු. 40,002. 2. රු. 30,000 3. රු. 34,000 4. රු. 39,000

35. මෙම ව්‍යාපාරයේ 2016.12.31න් අවසන් වර්ෂය සඳහා අදාල දළ ලාභය හා වාර්ෂික ශුද්ධ ලාභය පිළිවෙලින් දැක්වෙනුයේ,
1. රු. 66,000 හා රු. 40,000 2. රු. 70,000 හා රු. 40,000
3. රු. 66,000 හා රු. 30,000 4. රු. 60,000 හා රු. 24,000

36. මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි දැක්වෙන මෝටර් රථ හි ධාරණ විය හැක්කේ,
1. රු 285,000 2. රු. 270,000 3. රු. 300,000 4. 255,000

37. මෙම ව්‍යාපාරයේ ඇති ජංගම වගකීමක් වන්නේ,
1. බැංකු අයිරාව 2. බැංකු ණය 3. ලද වට්ටම් 4. මෝටර් රථ ක්ෂය

38. මෙම ව්‍යාපාරයේ 2016.12.31 න් අවසන් වර්ෂය සඳහා අදාල මෝටර් රථ ක්ෂය ප්‍රමාණය හා මූල්‍ය වියදම් වන්නේ,
1. රු. 30,000 හා රු. 50,000 2. රු. 15,000 හා රු. 25,000
3. රු. 15,000 හා රු. 5,000 4. රු. 45,000 හා රු. 5,000

39. බෙදාහැරීම් වියදම් වලට අයත් කාණ්ඩය තෝරන්න.
1. රක්ෂණය හා දුන් වට්ටම් 2. මෝටර් රථ ක්ෂය හා පරිපාලන ගාස්තු
3. පරිපාලන ගාස්තු හා රක්ෂණය 4. මෝටර් රථ ක්ෂය හා දුන් වට්ටම්

40. 2016.12.31 දිනට මුළු වත්කම් කීය ද?
1. රු. 265,000 2. රු. 255,000 3. රු. 150,000 4. රු. 190,000